## කප්සුව හස්කල්

කප්සුව හස්කල් පෙරුම් පුරාගෙන
අනන්ත බාධක දුක් පීඩා විඳ
භවෙන් භවය යන මං සලකුණු දැක
ඔබව සොයා ආවා-ඔබව සොයා ආවා

සත් සමුද්‍ර තරණය කර ආවා
සත්කුළු පව් අතරින් දිව ආවා //
තරු එළියෙන් පියවර මැන ආවා
ඔබව සොයා ආවා-ඔබව සොයා ආවා

නොනිමෙන ගමනක ආසා පොදිබැඳ
මිරිඟුව පසුපස දිවයන ඉකිබිඳ //
දිවි වෙණ වැයුමට ඔබ පසෙකින් හිඳ
ඔබව සොයා ආවා-ඔබව සොයා ආවා

*නන්දා මාලනී*